## දැයෙන් සමුගෙන 47 වසරක් සපිරෙන ආචාර්ය

# චාල්ස් ගොඩකුඹුර

**හිටපු පුරා විද්‍යා කොමසාරිස් ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතාගේ 47 වැනි ගුණ සමරුව අදට (10) යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**



ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැඳුණේ සහකාර කොමසාරිස්වරයෙකු ලෙසිනි. ඒ වනවිට ඔහු ලංකා විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකු වූයේ ය. ඊට පෙර චාල්ස් ගොඩකුඹුර මහතා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයෙන් සහ මහනුවර සංඝරාජ පිරිවෙනෙහි සිප්සතර හැදෑරුවේ ය. ශාස්ත්‍රීය පර්යේෂණ කිරීම සඳහා පෙරදිග භාෂා මෙන්ම අපරදිග භාෂා පිළිබඳ අවශ්‍ය දැනුමට අදාළ සිංහල පාලි සංස්කෘත හා ඉංග්‍රීසි භාෂා දැනුම එතුමාට තිබුණි. ලංකා විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතුවලින් පසුව ගොඩකුඹුර මහතා 1938 වර්ෂයේ දී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ඉන්දු - ආර්ය භාෂා පිළිබඳ ශාස්ත්‍රපති (MA) විභාගයෙන් ද සමත්වූයේය.

ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ප්‍රාචීන හා අප්‍රිකානු අධ්‍යයන අංශයේ සිංහල හා ඉන්දියානු අභිලේඛන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙසින් ද ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා සේවය කළේ ය. එමෙන් ම එහි පාලක මණ්ඩලයේ ද සාමාජිකයෙකු ලෙස සේවය කළේ ය.

1947 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙකු වූ ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා ඊට ඉහතදී තමා ඉගෙනීම කළ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ ගුරුවරයකු ලෙස ද කලක් ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්වරයෙකු ලෙස ද සේවය කර ඇත.

ආචාර්ය චාල්ස්ගොඩකුඹුර මහතා පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස 1962 සිට 1967 තෙක් ඉමහත් අගනා සේවාවක් කළේ ය. මේ කාලයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයක් ද ඇති කළේ ය. ආචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයාගේ කාලයේ ප්‍රකාශන අංශයක් නොතිබුණත් ඒ කටයුතු සාර්ථක ලෙසින් ඉටු කළ බව ද මෙහිදී සඳහන් කළයුතුව ඇත. ප්‍රකාශන හා ගවේෂණ අංශයක් ඇති කිරීම ද ආචාර්ය චාල්ස් ගොඩකුඹුර පුරාවිද්‍යා කොමසාරිස් තුමාගේ කාලයේ සිදු කළ ඉතා වැදගත් කාර්යයකි.

පුරා විද්‍යා ක්ෂේත්‍රයේ පමණක් නොව කලාව පිළිබඳ ජනතාවට අවබෝධයක් ලබාදීම සඳහා පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා විසින් ඉතා සරල බසින් ලියනලද කුඩා ග්‍රන්ථ ලිවීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතුව ඇත. කලා පොත් පෙළ නමින්වූ මෙම ග්‍රන්ථ සඳහා සඳකඩ පහණ, මුරගල්, බුදුපිළිමය, මැටිරූප, විසිතුරු මැට්උළු, තිවංක පිළිමගෙයි බිතුසිතුවම්, පනාවිටිය අම්බලම, දෙරුළුළුවහු පිළිබඳ මෙම ග්‍රන්ථ විද්වතුන් මෙන්ම අනෙකුත් පාඨක ජනතාව අතර ද ජනප්‍රිය විය. සිංහල සාහිත්‍යය පිළිබඳ ඉංග්‍රීසි බසින් ලියන ලද ඉතා ප්‍රකට ග්‍රන්ථයක්වූ SINALES LITERATURE (සිංහලීස් ලිට්‍රේචර්) (පිටු 375 පමණ) ග්‍රන්ථය ද 1955 දී ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා විසින් ලියන ලදුව පොතක් ලෙසින් ප්‍රකාශිත ය.

ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා විසින් පවත්වන ලද කථා හා ශාස්ත්‍රීය ලිපි ලේඛන අඩංගු පිටු පන්සිය (500) පමණ විශාල ග්‍රන්ථයක් ද 1971 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කළ සේවාවද අපට මෙහිදී සඳහන් කළ යුතුව ඇත.

1962 සිට 1967 තෙක් පුරාවිද්‍යා කොමසාරිස් තනතුර බැබළවූ ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා එකල බුරුමයේ (මියන්මාර්) රාජ්‍ය නායකයා ඉතා සමීපතම පෞද්ගලික හිතවතකු නිසා එහි සංචාරය සඳහා ගොස් සිටියදී 1977 පෙබරවාරි මස 10 වැනිදා අභාවප්‍රාප්ත වූයේ ය. එතුමාගේ ස්මාරකය බුරුමයේ (මියන්මාර්) හි පිහිටුවා ඇත.

හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂක
**සිරිසමන් විජේතුංග**